(අටවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 11.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2018 ජූනි 07 වැනි බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

2/'18

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017.09.06 දින වනවිට ජාතික විදුලි පද්ධතිය තුළ පවතින සූර්ය බලයෙන් උත්පාදනය කරනු ලැබූ සම්පූර්ණ විදුලිබල ප්‍රමාණය කොපමණද;

(ii) සූර්ය බලයෙන් විදුලිය උත්පාදනය කිරීම සඳහා සිදු කරනු ලබන සවිකිරීම් අධෛර්යමත් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් කටයුතු කරන බව දන්නේද;

(iii) සූර්ය බල සංග්‍රාමය ව්‍යාපෘතිය පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන්, දැනුවත් කිරීම සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

17/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කය තුළ ඇති සීමාසහිත ලංකා සතොස ශාඛා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශාඛාවල ලිපිනයන් කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා එම සතොස ශාඛාවල සේවය සඳහා බඳවාගත් පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් හා තනතුරු නාම කවරේද;

(iv) එම බඳවා ගැනීම් සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(v) මහනුවර දිස්ත්‍රික්කයේ ලංකා සතොස ශාඛා ජාලය පුළුල් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

36/'18

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 169 යෝජනාවට අනුව, කුරුඳු හා ඒ ආශ්‍රිත පර්යේෂණ සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 5ක ප්‍රතිපාදනය වැය කළ ආකාරය පිළිබඳ වැය විස්තරයක් ඉදිරිපත් කරන්නේද;

(ii) උක්ත අයවැය යෝජනාවට අනුව, 2016 වර්ෂය තුළදී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන භාවිතා කර සිදු කරන ලද පර්යේෂණ සංඛ්‍යාව, එම පර්යේෂණ සිදුකළ පර්යේෂකයන්ගේ නම් සහ ඒවායේ කාර්ය සාධන වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) කුළුබඩු (ගම්මිරිස්, කරාබු නැටි සහ සාදික්කා) අපනයන සඳහා වූ සෙස් බදු ඉවත් කිරීම හේතුවෙන් 2016 වර්ෂයේදී සෙස් බදු ආදායම් අහිමිවීමේ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

130/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, මධ්‍යම පළාත් සභාව යටතේ පාලනයවන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) දැනට එම පාසල් අතරින්, වැඩබලන විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) දැනට දිස්ත්‍රික්කයේ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව, එක් එක් අධ්‍යාපන කොට්ඨාසය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) මාතලේ දිස්ත්‍රික්කයේ විදුහල්පති පුරප්පාඩු හා ගුරු පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

157/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනගත් පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

192/'18

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ දෙසැම්බර් මාසයේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති වූ දැඩි ගංවතුර තත්ත්වය හේතුවෙන් කින්නියා ප්‍රදේශයේ කුරින්ජක්කේනි පාලම විනාශ වූ බවත්;

(ii) මේ දක්වා එම පාලම සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය නොකර තාවකාලිකව ප්‍රතිසංස්කරණය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දෛනිකව විශාල ජනතාවක් විසින් භාවිතා කරනු ලබන මෙම පාලම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ගනු ලැබූ පියවර කවරේද;

(ii) මේ දක්වා මෙම පාලම ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතු කවරේද;

(iii) මෙම පාලම හැකි ඉක්මනින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

194/'18

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2015 දක්වා වූ කාල පරිච්ඡේදයේදී, සීමාසහිත ලංකා රෝහලේ කොටස් හිමියෙකු ලෙස ගෝඨාභය රාජපක්ෂ මහතා කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම කාල පරිච්ඡේදය තුළදී සීමාසහිත ලංකා රෝහලේ සභාපති ලෙස ඒ මහතා ලබාගත් වැටුප් සහ දීමනා කවරේද;

(iii) වර්ෂ 2010 සිට 2015 දක්වා කාලය තුළ සීමාසහිත ලංකා රෝහල වාර්තා කළ වාර්ෂික ලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

215/'18

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය යුදමය තත්ත්වය හේතුවෙන් අවතැන් වූ පවුල් 150ක් අවුරුදු 25ක් පුරා වවුනියාව පූන්තෝට්ටම් සුභසාධන කඳවුරේ වාසය කරන බවත්;

(ii) මෙම පවුල් 150 නෙඩුන්කේනි, සින්න අඩම්පන් ප්‍රදේශයේ නැවත පදිංචි කරන බවට වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දැනුම් දී තිබියදී, මෙම පවුල් සඳහා වූ නිවාස කොටස් දෙකකට බෙදා නෙඩුන්කේනි සින්න අඩම්පන් ප්‍රදේශයේ නිවාස 68ක් සහ පුලියන්කුලම් ප්‍රදේශයේ නිවාස 82ක් වශයෙන් ''ලයිකා ඥානම් පුණ්‍යායතනය'' විසින් ඉදිකරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස 150හි එකී ජනතාව නැවත පදිංචි වී සිටින්නේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

309/'18

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය යටතේ ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් නමින් ආයතනයක් තිබුනේද;

(ii) එම ආයතනයේ නම වෙනස් කර තිබේද;

(iii) එසේ නම්, එහි වර්තමාන නම කවරේද;

(iv) සී/ස එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පෞද්.) සමාගමට අයත් කොටස් බෙදී ගොස් ඇත්තේ කෙසේද;

(v) ESOT (භාරය) කොටස්කරුවන් සතුව ඇති කොටස් පාලනය කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(vi) එහි කොටස්කරුවන්ගේ නම් හා ඔවුන් සතුව ඇති කොටස් සංඛ්‍යාව පිළිබඳ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(vii) සේවකභාර ගිවිසුම් අනුව, එය පිහිටුවා කොපමණ කාලයක් ඇතුළත ඔවුන්ගේ කොටස් පිළිබඳව හා ඔවුන් කොටස්කරුවන් බව දන්වා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ESOT සමාගමෙහි ආරම්භක කොටස්කරුවන් කවුරුන්ද, ඔවුන් සතුව තිබූ කොටස් ප්‍රමාණය කොපමණද;

(ii) එම කොටස්කරුවන් අතර ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් සිටින්නේද;

(iii) එසේ නම්, ඔවුන්ට ලැබෑදියාව පිළිබඳව පිළිගැටුම තිබෙන බව එතුමා පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) COPE වාර්තාවේ සඳහන් පරිදි සී/ස එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පෞද්.) සමාගමෙන් රුපියල් දස ලක්ෂ 232 ක ලාභාංශ ප්‍රමාණයක් ලංකා විදුලිබල මණ්ඩලයට නොගෙවා තිබෙන බව දන්නේද;

(ii) මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

391/'18

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ තිබෙන දෙමළ මාධ්‍ය පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතරින් ප්‍රාථමික හා ද්විතීක පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පාසල්වලින් මධ්‍යම රජයට අයත් පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(v) දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය හදාරන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රත්නපුර දිස්ත්‍රික්කයේ,

(i) 2010 වර්ෂයේ සිට මේ දක්වා 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් හා අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2010 වර්ෂයේ සිට මේ දක්වා අ.පො.ස. (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් හා අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඉංජිනේරු හා වෛද්‍ය විද්‍යාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iv) සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය ශිෂ්‍යයන් අතර ඉහත විභාග සමත් සහ අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

406/'18

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තිරියාය ප්‍රදේශයේ පිහිටි ගිරිහඬු සෑය පූජා භූමියට අයත් ඉඩම් මැන අවසන් කර තිබේද;

(ii) එසේ නම්, මැන හඳුනාගත් භූමිය මත සලකුණු යෙදීම සිදුකර තිබේද;

(iii) මැනීම් මගින් හඳුනාගෙන ඇති පූජා භූමියට අයත්වන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) අදාළ පිඹුරුපත් බුද්ධශාසන අමාත්‍යාංශයට ලබා දීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

408/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් පිරිසිදු පානීය ජලය සපයනු ලැබ තිබූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට පිරිසිදු පානීය ජලය සපයනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) 1983 වර්ෂයෙන් පසුව යුදමය තත්ත්වය නිමවන තුරු පානීය ජලය ලබාදීම වෙනුවෙන් එක් එක් වර්ෂය සඳහා රජය විසින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

(iv) යුදමය තත්ත්වය නිමවීමෙන් පසු 2015 වර්ෂය වනතෙක් පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘති වෙනුවෙන් රජය වෙන් කරන ලද මුළු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

422/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ධාතුසේනපුර, කලාවැව, මහඅක්කරය වත්ත සහ කැළණිවත්ත යන ප්‍රදේශවල කුඹුරු ඉඩම් අක්කර 100 ක පමණ ප්‍රමාණයක් කුරුණෑගල වැවිලි සමාගමකට බදු දී ඇති බවත්;

(ii) මෙම ඉඩමේ අඳ ගොවීන් ලෙස ගොවීන් දීර්ඝ කාලයක් පුරා ගොවිතැන් කටයුතුවල නියැලෙන බැවින්, වැවිලි සමාගමෙන් මෙම ඉඩම් නිදහස් කර අඳ ගොවීන්ට සින්නක්කර අයිතිය ලබාදීමට කටයුතු කරන මෙන් ඉපලෝගම ප්‍රාදේශීය ලේකම්වරයා සහ ඉඩම් අමාත්‍යාංශය දැනුවත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ඉඩම්වල සින්නක්කර අයිතිය මෙම ගොවීන්ට ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

438/'18

ගරු ජයන්ත සමරවීර මහතා,— විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017.03.31 දිනට විදේශයන්හි සේවයේ නියුතුව සිටින ශ්‍රී ලාංකික පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන් සංඛ්‍යාව, ඔවුන් සේවයේ යෙදී සිටින රට අනුව, රැකියා වර්ගීකරණය අනුව සහ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය අනුව;

(ii) එම පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව සහ සිංහල, දෙමළ, මුස්ලිම් හා වෙනත් ජාතීන්ට අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

472/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභාව තුළ සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින අක්‍රමිකතා සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් අංක SIN/B/AG/KI/2017/02 හා 2017.04.20 දිනැති විමර්ශන වාර්තාවක් ඌව පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති අතර එම වාර්තාවේ ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පාසල් බෑග් ලබාදීම සම්බන්ධව අනාවරණය කර ඇති ඡේද අංක 4 (ආ) (i) සිට (vii) දක්වා කරුණු මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(ii) එම අනාවරණයන්ට අදාළව (ආ) (i) සිට (v) දක්වා සිදු කර ඇති නිරීක්ෂණ ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 8හි විධිවිධානවල සහ 2018.06.06 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 7.00 දක්වා විය යුතු ය. අ.භා. 1.30 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 7.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 1),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32(1) වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජනවාරි 18 දිනැති අංක 2054/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.22 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 03/2018 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 2),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 25 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජනවාරි 18 දිනැති අංක 2054/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.22 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 04/2018 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදන (අංක 3),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 2 සහ 22 වගන්ති යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජනවාරි 23 දිනැති අංක 2055/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.22 දින ඉදිරිපත් කරන ලද නිවේදන අනුමත කළ යුතු ය.

(අංක 05/2018 සහ 06/2018 දරන සුරාබදු නිවේදන)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 4),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 2, 12, 22 සහ 25 වගන්ති යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 පෙබරවාරි 21 දිනැති අංක 2059/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.22 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 07/2018 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 දෙසැම්බර් 11 දිනැති අංක 2049/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.20 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 1004 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 දරන හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3) වගන්තිය සහ 14 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ 2017 ආනයන හා අපනයන පාලන (ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන) නියෝග සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මාර්තු 29 දිනැති අංක 2064/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 59 සහ 63 වගන්ති සමඟ කියවිය යුතු, 142(2) වගන්තියේ (ද) ඡේදය යටතේ 2017 අංක 2 දරන ඖෂධ ලියාපදිංචි කිරීම (ගාස්තු) නියෝග සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 05 දිනැති අංක 2052/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.04.03 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*9.

ජාතික විගණන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණය කිරීමේ පනත් කෙටුම්පත — කාරක සභාව.

*11.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

සුරැකුම්පත් විනිමය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අල්ලස් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2016),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.11.16 වැනි දින ඉදිරිපත් කරන ලද 2016.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.06 දින සලකා බලන ලදී.)

*21.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.11.24 වැනි දින ඉදිරිපත් කරන ලද 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.06 දින සලකා බලන ලදී.)

*22.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2016),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.12.04 වැනි දින ඉදිරිපත් කරන ලද 2016.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.06 දින සලකා බලන ලදී.)

*23.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2015),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.11.07 වැනි දින ඉදිරිපත් කරන ලද 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.06 දින සලකා බලන ලදී.)

*24.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2017.06.23 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.09.21 දින සලකා බලන ලදී.)

*25.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2017.11.11 වැනි දින ඉදිරිපත් කරන ලද 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.06 දින සලකා බලන ලදී.)

*26.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.08.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද ස්වාධීන විගණකවරුන්ගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.09.21 දින සලකා බලන ලදී.)

*27.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2012),— 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වැනි වගන්තිය යටතේ 2017.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද 2012.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.11.10 දින සලකා බලන ලදී.)

*28.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වැනි වගන්තිය යටතේ 2017.12.07 වැනි දින ඉදිරිපත් කරන ලද 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.20 දින සලකා බලන ලදී.)

*29.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වැනි වගන්තිය යටතේ 2017.12.07 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.20 දින සලකා බලන ලදී.)

*30.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වැනි වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ වගන්ති II ට අනුව 2017.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.02.20 දින සලකා බලන ලදී.)

*31.

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා,— පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව,— 2017 අංක 17 දරන පනතින් සංශෝධිත 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 3අ. (11) වගන්තිය ප්‍රකාරව සීමා නිර්ණය කමිටුව විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදුව 2018.03.06 දින පාර්ලිමේන්තුවේදී සභාගත කරන ලද එකී කමිටුවේ වාර්තාව අනුමත කළ යුතු ය.

*32.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතියට යටත්ව 2015.11.27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා විගණකාධිපතිවරයා වශයෙන් පත්කර ඇති හෙයින්ද;

විගණකාධිපතිවරයාගේ වැටුප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;

ජනාධිපතිවරයා විසින් 2017.11.14 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව 2017.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතාට පහත පරිදි වැටුප් හා දීමනා ගෙවීමට අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) 2015.11.27 වැනි දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 අනුව SL - 4 වැටුප් පරිමාණයේ 08 වැනි වැටුප් පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම හා තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීමට;

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව 2016.01.01 වැනි දින සිට වැටුප පරිවර්තනය කිරීමේ දී SL – 4 වැටුප් ක්‍රමය යටතේ එම චක්‍රලේඛයේ උපදෙස් පරිදි වැටුප් පරිවර්තනය කර ගෙවීමට; සහ

(ඇ) එකී වැටුප් පරිමාණයට අදාළ වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව, විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

*33.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5) (අ) ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදන ලද, 2017 දෙසැම්බර් 04 දිනැති අංක 2048/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු, මාධ්‍ය උපමාන අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*34.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*35.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*36.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

37.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

38.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

39.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

40.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

41.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

42.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

43.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

44.

ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

45.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***